**ශීර්ෂය 294 - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය මතය සඳහා පදනම**

------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-----------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින්ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන, ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් කිරීමේ අදහසින් නොවුවද, අවස්ථානෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි

- භාවිතා කරන ලද ගිණුම් ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වශයෙන් රු.462,625,337 ක් දක්වා තිබුණද ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව එම වියදම රු.455,570,743 ක් වීමෙන් රු.7,054,594 ක වෙනසක් නිරීක්ෂණය විය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය මාසික ගිණුම් සාරාංශ හා භාණ්ඩාගාර සටහන් සමඟ සසඳා නිවැරදිව පිළියෙල කළ යුතුය. | මෙහෙයුම් ක්‍රියාකාරකම් හා ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කර ඇති මුදල් ලෙස මූල්‍ය ප්‍රකාශයේ දක්වා ඇති ශේෂයය ලබා ගෙන ඇත්තේ පහත පරිදි බව කාරුණිකව දන්වා සිටිමි.<br><br>පුද්ගල පඩිනඩි හා<br>මෙහෙයුම් වියදම් = රු.457,814,943 (ඒසීඒ -එෆ්)<br>**<u>එකතු කළා</u>**<br>රජයේ ආදායමෙන්<br>ආපසු ගෙවීම = රු.5,063,924 (අග්‍රිම සැසඳීම)<br>**<u>අඩු කළා</u>**<br>දුම්රිය දෙපාර්තමේන්තුව<br>විසින් කරන ලද<br>හර කිරීම <u>= රු.253,530</u> (අග්‍රිම සැසඳිම)<br>**මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින්**<br>**ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** <u>= රු. 462,625,337</u> |

| | | |
|---|---|---|
| (ii) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වැය කරන ලද මුදල් ප්‍රවාහයේ සහනාධාර හා මාරු කිරීම් යටතේ කිසිදු ගෙවීමක් දක්වා නොතිබුණද ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව එහි රු.1,990,669 ක ශේෂයක් නිරීක්ෂණය විය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය මාසික ගිණුම් සාරාංශ හා භාණ්ඩාගාර සටහන් සමඟ සසඳා නිවැරදිව පිළියෙල කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

----------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ඇප ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. | ඉදිරියේ මෙම ලේඛනය පිළියෙල කිරිමට අවශ්‍ය උපදෙස් මහා භාණ්ඩාගරය මඟින් ලබා ගෙන ඇති අතර ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| **(ආ) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 454(2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතුය. | ප්‍රධාන ගබඩාවන්හි මේ සඳහා වෙනම ලේඛන පවත්වා ගෙන යන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 1.6.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මේ සම්බන්ධයෙන් රජයේ විගණන අංශය මඟින් අවශ්‍ය උපදෙස් ලබා ගෙන අවශ්‍ය කටයුතු සිදුකරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| 1982 අංක 41 දරන ජාතික සත්වෝද්‍යාන පනතේ III කොටස | අධ්‍යක්ෂවරයාට උපදෙස් දීමේ සහ අමාත්‍යවරයා වෙත නිර්දේශයන් කිරීමේ කාර්ය සඳහා උපදේශක කාරක සභාවක් අමාත්‍යවරයා විසින් පත් | සත්වෝද්‍යාන පනත අනුව කටයුතු කළ යුතුය. | විෂයභාර අමාත්‍යවරයා විසින් සත්වෝද්‍යානය සම්බන්ධයෙන් උපදෙස් දීම සඳහා උපදේශක කාරක සභාවක් පත් කිරීම මේ වන තෙක් |

| | | |
|---|---|---|
| | කරනු ලැබිය යුතු වුවද එසේ උපදේශක කාරක සභාවක් පත්කර නොතිබුණි. | සිදුකර නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ට අනුකූලව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂය සඳහා පිළියෙල කළ ඇස්තමේන්තුවේ වැය විෂයන් 06 ක සියයට 34 සිට සියයට 84 දක්වා පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය. | නිවැරදිව ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කළ යුතුය. | ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛ අංක 03/2019, 04/2019, 05/2019 අනුව කටයුතු කිරිමට සිදුවීම හේතුවෙන් මෙම වැය විෂයයන්වල ඉතිරිවීම් සිදුවී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව යම් දෙපාර්තමේන්තුවක් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට ඉඩ නොදිය යුතු වුත් වැය විෂයන් 06 කට අදාළව රු.674,569 ක ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට එළඹී තිබුණි. | මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අතිකාල, ගමන් වියදම්, සංග්‍රහ හා නිල ඇඳුම් සඳහා ප්‍රතිපාදන ඉක්මවා ගෙවීම් සිදු කිරීම හේතුවෙන් ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට එළඹීමට සිදුව ඇත. |

## 2.3 තැන්පත් ශේෂයන්

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.5,373,650 ක් වූ තැන්පතු අදාළ ගිණුම්වලට බැර නොකර වර්ෂ 02 සිට වර්ෂ 05 දක්වා කාලයක් තුළ පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | ප්‍රතිවාර නොදක්වන ශේෂයන් රජයේ ආදායම බැර කිරීමට කටයුතු කල යුතුය. | වර්ෂ 02 සිට වර්ෂ 05 දක්වා කාලයක් තුල පොදුතැන්පත් ගිණුමේ රඳවා ඇති ශේෂ සම්බන්ධයෙන් අදාළ පාර්ශව දැනුවත් කිරිම සිදුකර ප්‍රතිවාර නොලද තැන්පතු ඉදිරියේදී රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

## 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ක්‍රියාකාරී සැලැස්මේ දැක්වෙන පරිදි ව්‍යාපෘති දොළහකට අදාළව රු.මිලියන 145 ක් වෙන් කර තිබුණද ඉන් රු.මිලියන 65.6 ක් පමණක් වැයකර තිබුණි. ඒ අනුව අපේක්ෂිත ප්‍රතිඵලය අත්පත් කර නොගෙන වර්ෂය අවසන් වන විට රු.මිලියන 79.4 ක ඉතිරිවීම් තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. | 2019 වර්ෂයේ අප්‍රේල් මස සිදුවූ පාස්කු ප්‍රහාරය හේතුවෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛ අංක 03/2019, 04/2019, 05/2019 අනුව නව ව්‍යාපෘතීන් ආරම්භ කිරීම් සිදුනොකර ලෙසත් ප්‍රාග්ධන වැය විෂයයන්ගෙන් 25%ක අනිවාර්යය ඉතිරියක් සිදුකරන ලෙසත් දන්වා ඇති බැවින් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමේ හා වැඩ නිම කිරීමේ ප්‍රමාදයක් සිදුවී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

## 3.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 28.5 ක් වූ ව්‍යාපෘති 05 ක් අදාළ කොන්ත්‍රාත් සමාගමේ ප්‍රමාදයන් හේතුවෙන් 2019 වර්ෂය අවසන් වන විට නිම නොකර අත්හැර දමා තිබුණි. ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුවීම හා ගිවිසුම් ප්‍රකාරව අදාළ ව්‍යාපෘති ඉටු කරවා ගැනීමට කටයුතු කළ යුතුය. | ව්‍යාපෘතින් 03 ක ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සඳහා යෝජනා 02 ක් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත 2019 නොවැම්බර් 27 දින ලිඛිතව දන්වා ඇත. එහෙත් මේ වන තෙක් එම ආයතනය ඒ සඳහා ලිඛිත පිළිතුරක් ලබා දී නොමැත. දෙපාර්තමේන්තුව විසින් මෙම ආයතනය සමඟ පැවැති සාකච්ඡාවන්හිදී මෙම ව්‍යාපෘතීන්හි ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කරන බව වාචිකව දන්වා ඇති බව වැඩිදුරටත් දන්වා සිටිමි. එසේම SBD/03 හි 11.1 වගන්තිය අනුව වැඩ අවසන් කිරීම වන බව හා අවශ්‍ය මිනුම් කටයුතු කරන ලෙස 2019 පෙබරවාරි 05 දිනැති ලිපිය මඟින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත දන්වා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ ගබඩාව අසල වටිනාකම රු.914,250 ක් වූ සත්ව කූඩු ආවරණ දැල් 23 ක් නිශ්කාර්යව පැවතුණි. | සත්ව කූඩු ආවරණ දැල් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | මේ වන විට මෙම දැල් ප්‍රමාණයෙන් 06 ක් පමණක් ඉතිරිව ඇත. ඉදිරියේදී භාවිතයට ගැනීමට හැකියාව ඇති බැවින් නිෂ්කාර්යව නොපවතින බව දන්වා සිටිමි. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පින්නවල අලි අනාථාගාරයේ අලින් රඳවා සිටින ස්ථාන අදාළ අලි වසුරු හා ඉතිරි වූ ආහාර කොටස් ගොඩ ගසා තිබූ බැවින් පරිශ්‍රය අපවිත්‍රව පැවතුණි. | අලි වසුරු ප්‍රතිචක්‍රීකරණය කිරීමට කටයුතු කල යුතුය. | පොහොර ලෙස භාවිතා කල හැකි තත්වයට පත් කිරීමට යන්ත්‍රයක් ලබා ගැනීමට සැලසුම් කලද රටේ පවතින වාතාවරණ හේතුවෙන් සිදු කිරීමට නොහැකි විය. |
| (ආ) | නාරම්බැද්ද අලි නිරෝධායන මධ්‍යස්ථානයේ අප ජලය පිටවීම සඳහා විධිමත් කාණු පද්ධතියක් ඉදිකර නොතිබූ බැවින් කිසිදු පිරිපහදු කිරීමකින් තොරව අසල පිහිටි මා ඔයට මුදා හැර තිබුණි. | විධිමත් කාණු පද්ධතියක් ඉදි කල යුතුය. | නාරම්බැද්ද අලි නිරෝධායන මධ්‍යස්ථානයේ අප ජලය පිරිසිදු කිරීමට අප ජල පිරිපහදු පද්ධතියක් පිහිටුවා නොමැත. පිරිසිදු කිරීමට යොදා ගන්නා අප ජලය හා අලි මුත්‍රා පමණක් මෙසේ අප ජලය ලෙස එහි ජනිත වන අතර, එම ජල ප්‍රමාණය මා ඔයට ගලා යාමට තරම් ප්‍රමාණයක් එක්රැස් නොවේ. පිරිසිදු කිරීම සඳහා රසායනික ද්‍රව්‍ය භාවිතා නොකරන නිසා අප ජලය ලෙස ස්වභාවික ද්‍රව්‍ය පමණක් මා ඔයට බැහැර කරන නිසා අපිරිසිදු වීමක් සිදු නොවන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඇ) | ජලය පිරවීම සඳහා පොළව මට්ටමේ සිට අඩි 02 ක් උසකින් හා ස්වයංක්‍රීයව පිරෙන සේ ජලය බඳුන් සැකසිය යුතු වුවත් නාරම්බැද්ද අලි නිරෝධායන මධ්‍යස්ථානයේ වෙසෙන අලින් සඳහා ඉදිකර තිබූ බඳුන් ස්වයංක්‍රීයව පිරන සේ සකසා නොතිබුණි. බීමට සපයා තිබූ ටැංකිවලද ජලය පුරවා නොතිබුණි. | නියමිත ප්‍රමිතියට අනුකූලව ඉදි කිරීම් සිදුකල යුතුය. | අලි ඇතුන් නොමැති අවස්ථාවල මෙම අලි පන්තිවල ජල ටැංකි පුරවා තැබීම අවශ්‍ය නොවන බව කාරුණිකව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මධ්‍යම පරිසර අධිකාරියෙන් නිකුත් කරනු ලබන අංක 04459($R^6$) දරන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි ප්‍රකාරව යම් ස්ථානයකින් අප ජලය බැහැර කිරීමේදී අවම වශයෙන් එම ජල ධාරිතාවය මෙන් 8 ගුණයක්වත් පිරිසිදු ජලය සමඟ මිශ්‍රකර මුදාහැරීම සිදු කළ යුතුය. ඊට පටහැනිව දෙහිවල සත්වෝද්‍යානයෙන් පිටකරනු ලබන ජලය අසල පිහිටි ගල් වළ නැමති ස්ථානයට මුදා හරින බව විගණනයේදී නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස අපිරිසිදු ජලය තත්වීකරණයෙන් තොරව මුදාහැරීම අවට ජල මූලාශ්‍ර අපිරිසිදු වීමටත් අවට ජනතාවගේ සෞඛ්‍යයට අහිතකරව බලපෑමටත් හේතුවී තිබුණි. | මධ්‍යම පරිසර අධිකාරියෙන් නිකුත් කරනු ලබන අංක 04459($R^6$) දරන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වාතනය ( Aeration) කිරීම සඳහා ක්‍රමෝපායන් යොදා ගනිමින් ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව කාරුණිකව සඳහන් කර සිටිමි. |
| (ඉ) | පශු වෛද්‍ය විසින් සතුන්ට ලබාදීමට නිර්දේශ කරනු ලබන ආහාර මැනීමකින් තොරව අත්දැකීම් හා පලපුරුද්ද මත ලබා දෙන බව නිරීක්ෂණය විය. ඒ අනුව ආහාර නියමිත ප්‍රමාණයම ලබා දෙනවාද යන්න තහවුරු කර ගත නොහැකිය. | පශු වෛද්‍යවරයාගේ නිර්දේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | සතුන්ට දෙනු ලබන මස් පමණක් මිනුම්කර ලබා ගන්නා අතර අනෙකුත් ද්‍රව්‍ය අත්දැකීම හා පලපුරුද්ද මත ලබා දෙනු ලබයි. මැනීමට කාලයක් ගත වීම හා ඒ සඳහා උපකරණ ප්‍රමාණවත් නොවීම මත සියළුම දේ මැනීමට කටයුතු නොකරන ලදී. මැනීමට අවශ්‍ය උපකරණ ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. |

| | | |
|---|---|---|
| (ඊ) 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ ගෝනපළ ගොවිපල තුල වගා කිරීමේ කටයුතු නිසි සැලැස්මකට අනුව සිදු කර නොතිබූ බැවින් එහි වගාව වැඩි කර බාහිර ආයතනයන්ගෙන් මිලදී ගන්නා සත්ව ආහාර ප්‍රමාණය අඩු කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගෝනපොළ ගොවිපොළ සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතුය. | ගොවිපල තුළ ප්‍රධාන වශයෙන් CO4 තණකොළ බ්‍රිසන්තා තණකොළ කංකුං උක්ගස් හා කෙසෙල් වගා කිරීම සිදු කරනු ලබන අතර මෙම බෝග ප්‍රවාහයන් දෙහිවල සත්වෝද්‍යානය වෙත ලබා දීම සිදු කරයි. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්කයන් හඳුනාගෙන තිබුණද ඒවා ළඟා කර ගැනීමට හැකිවන අයුරින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්ම තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්කයන් ළගා කර ගැනීමට හැකිවන අයුරින් පිළියෙල කල යුතුය. | තිරසර සංවර්ධන අරමුණු 15 ට අනුව සත්ව සංරක්ෂණ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා සංරක්ෂණ මධ්‍යස්ථාන ඉදි කිරීම, අලි ඇතුන් වඳ වී යාමේ තර්ජනයට ලක් වී ඇති සතුන් බෝ කිරීමට සඳහා ක්‍රමවේද සකස් කිරීම හා නරඹන්නන් සඳහා සතුන් ප්‍රදර්ශණය මඟින් සතුන් හා සතුන් ජීවත් වන පරිසර පද්ධතීන් ගැන දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකිරීම ආදී නිශ්චිත ඉලක්ක හඳුනාගෙන ඇති අතර ඒවා ක්‍රියාකාරි සැලැස්ම හරහා ළඟා කර ගැනිමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු තනතුරු 124 ක් වූ අතර ඉන් ජොෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක හා ද්විතික මට්ටමේ තනතුරු 31 ක පුරප්පාඩු පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය අවම මට්ටමක පැවතුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. | මෙම තනතුරුවලින් ජොෂ්ඨ මට්ටමේ තනතුරු 3 ක් සම්පූර්ණ කිරීමට අවශ්‍ය තොරතුරු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කිරීම සිදුකර ඇත. දෙපාර්තමේන්තු ගත ද්විතික තනතුරු 30 සම්පූර්ණ කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ කටයුතු සම්පාදනය කිරීමට කටයුතු කල නමුත් 2019 වර්ෂයේ පැවැත්වූ ජනාධිපතිවරණය හා 2020 වර්ෂයේ පැවැත්වූ පාර්ලිමේන්තු මැතිවරණය හේතුවෙන් එම බඳවා ගැනීම් සිදුකිරීම තාවකාලිකව අත්හිටුවීමට සිදුවූ බව කාරුණිකව දන්වා සිටිමි. |